විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS
ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions
පරපුරක අභිමානය
தலைமுறையொன்றின் பெருமிதம்
Pride of a Generation

මගේ අංකය / எனது இல. / My No. } විවැ/දි.ස/ජී.ස/2020

ඔබේ අංකය / உமது இல. / Your No. } ..........................

දිනය / திகதி / Date } 2019/12/06

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත

**විශ්‍රාමික පදිංචි සහතිකය 2020**

2020 වර්ෂය සඳහා මුළු දිවයිනම ආවරණය වන පරිදි විශ්‍රාමික පුරවැසියන් ගෙන් ලබා ගත යුතු විශ්‍රාමික පදිංචි සහතික ආකෘතිය මේ සමඟ ඔබ වෙත එවමි. 2020 වසර සඳහා මෙම ආකෘතිය හැර වෙනත් පරිබාහිර ආකෘති ලබා ගැනීමෙන් වලකින ලෙස කාරුණිකව දන්වමි.

02. විශ්‍රාම වැටුප් ගෙවීමේදි භාරකරුවන් හරහා ගෙවනු ලබන විශ්‍රාම වැටුප් භාරකාර තොරතුරු, අනිවාර්යයෙන්ම මෙම ආකෘතියේ අංක 08 යටතේ සම්පූර්ණ කර ගත යුතු අතර එම ආකෘති පළමුව ඔබ පරිගණක පද්ධතියේ ආදානය කිරීමෙන් අනතුරුව ලේඛණයක් සමඟ නොපමාව අදාල පදිංචි සහතිකය විශ්‍රාමිකයාගේ ගොනුවට ගොනුකල යුතුය.

03. ජීවිත සහතික ලබා ගැනීමේදී පහත සඳහන් අඩුපාඩු සිදු වී ඇති බව විගණනයේදී අනාවරණය වී ඇති අතර එම තත්වය නිවැරදි කර ගැනීමට මෙම අවස්ථාවේ කටයුතු කල යුතුය. එනම්,

i. ජාතික හැඳුනුම්පත් අංකය අනිවාර්යයෙන්ම ඇතුලත් වී ඇති බවට සහතික විය යුතුය.

ii. විශ්‍රාමිකයාගේ අත්සන හා දිනය අනිවාර්යයෙන්ම තිබිය යුතු අතර ග්‍රාම නිලධාරි විසින් නිල මුද්‍රාව තබා සහතික කර තිබිය යුතුය.

iii. ඇඟිලි සළකුණු මඟින් ජීවිත සහතිකය ලබා දීමේදී එයට හේතුව විශේෂ සටහන් ලෙස ග්‍රාම නිලධාරි විසින් ඇතුලත් කර තිබිය යුතුය.

iv. ජීවිත සහතික, පද්ධතිය තුල 2020.03.31 දිනට පෙර යාවත්කාලීන කල යුතුය. ජීවිත සහතිකය යාවත්කාලීන නොවන විශ්‍රාමිකයන්ගේ වැටුප් 2020 මැයි මස වන විට අත්හිටුවීමට සිදුවන බව දන්වමි.

04. තවද ජීවිත සහතික ලබා ගැනීමේදී පූජ්‍ය පක්ෂය සම්බන්ධයෙන් කටයුතු කල යුතු ආකාරය දැක්වෙන අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක HAF-2/15 CORDI/1507-(SUB 1) හා 2019.11.06 දිනැති ලිපිය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරන මෙන්ද වැඩිදුරටත් දන්වමි.

ජේ.ජගත් ඩී.ඩයස්
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් - සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත

මාළිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை கொழும்பு 10. Maligawatta, Colombo 10.
Hot line: 1970, Direct line: 2209800, Fax: 2342078, Email: info@pensions.gov.lk, Web: www.pensions.gov.lk

ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions

**මෙය නොමිලයේ නිකුත් කරනු ලබන ආකෘතියකි.**

# විශ්‍රාමික පදිංචි සහතිකය -2020

අනු අංකය
(ග්‍රාම නිලධාරී වෙත අංක කිරීම සඳහා )

විශ්‍රාම වැටුප් ගෙවීමට අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

**2020 නව වසර ඔබටත්, පවුලේ සැමටත් සාමය, සතුට හා සෞභාග්‍ය සපිරි සුභ නව වසරක් වේවා !**

විශ්‍රාම වැටුප් ලබාගන්නා ඔබ වාර්ෂිකව ලබාදිය යුතු මෙම සහතිකය සම්පූර්ණ කර ඔබ පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී මහතා/මහත්මිය වෙත 2020.03.31 දිනට පෙර ලබාදෙන්න. නැතහොත් 2020 මැයි මස සිට විශ්‍රාම වැටුප් ගෙවීම අත් හිටුවීමට සිදුවන බව කරුණාවෙන් සලකන්න.

1. මුලකුරු සමඟ නම
2. ජාතික හැඳුනුම්පත් අංකය (අනිවාර්යවේ)
3. උපන් දිනය (වර්ෂය/මාසය/දිනය)
4. විශ්‍රාම වැටුප් — වර්ගය / අංකය
5. පදිංචි ලිපිනය
6. දුරකථන අංක - නිවස
   ජංගම

   **මාසික වැටුප් ගෙවීම් විස්තර ජංගම දුරකතනයට එවීමට සැලසුම් කර ඇති බැවින් ජංගම දුරකතන අංක ඇතුලත් කිරීම අනිවාර්ය බව සලකන්න.**
7. ග්‍රාම නිලධාරී වසම/අංකය
8. භාරකරුවෙකු සිටිනම් නම

8.1 ඔහු/ඇයගේ ජාතික හැඳුනුම්පත් අංකය

8.2 ඔහු/ඇයගේ දුරකතන අංකය - නිවස
ජංගම

**මා විසින් ඉහත සඳහන් කරන ලද කරුණු සත්‍ය බව ප්‍රකාශ කරමි.**

දිනය.......................................

විශ්‍රාම වැටුප් ලාභියාගේ අත්සන..................................................

## ග්‍රාම නිලධාරී වාර්තාව

**නිරීක්ෂණ**

ඉහත විශ්‍රාමික ස්වාමීන් වහන්සේ/පූජකතුමා/මහතා/මහත්මිය/මෙනවිය මෙම ග්‍රාම නිලධාරී වසමේ අදාල ලිපිනයෙහි ස්ථිර/තාවකාලික පදිංචිකරුවකු බව සහතික කරමි. උන්වහන්සේ /ඔහු/ඇය තනිව කටයුතු කර ගැනීමට හැකි යහපත් සෞඛ්‍ය තත්ත්වයකින් ඇත/නැත. මෙම නම ඡන්ද හිමි නාම ලේඛනයේ සඳහන්ව ඇත/නැත.

දිනය..............................

..................................................
ග්‍රාම නිලධාරී අත්සන හා නිල මුද්‍රාව

අනු අත්සන් කරමි.

දිනය.....................................

..................................................
ප්‍රාදේශීය ලේකම් අත්සන හා නිල මුද්‍රාව

මෙම පදිංචි සහතිකය පුරවා ග්‍රා.නි වෙත බාරදුන්නේ කවුරුන්ද යන වග
(අදාල කොටුව තුල (✔)ලකුණ යොදන්න)

| විශ්‍රාමිකයා | | භාරකරු | |
|---|---|---|---|

.............................................. **මෙතනින් වෙන් කරන්න** ..............................................

## පදිංචි සහතිකය බාරගත් බවට දැනුම් දීම

විශ්‍රාම වැටුප් අංකය ..........................................
ලබාදුන් විශ්‍රාමික පදිංචි සහතිකය බාරගත් බව සහතික කරමි.

නම ..........................................................

බාරගත් දිනය ..................................

..................................................
විශ්‍රාම විෂයභාර නිලධාරී/ ග්‍රාම නිලධාරී